# ජාතික රාජ්‍ය සභාවේ
# 1973 අංක 39 දරන විනිමය පාලන
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 39 දරන
මිනිමය පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 30/70.

මිනිමය පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 39 දරන විනිමය පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන විනිමය පාලන පනතේ 5 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 4වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) බැංකුවේ අවසරය ඇති ව හැර—

(අ) බලය ලත් වෙළෙන්දකු නො වන කිසි ම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාව තුළදී, බලය ලත් වෙළෙන්දකු නො වන යම් කිසි තැනැත්තකුගෙන් රත්රන් හෝ විදේශීය ව්‍යවහාර මුදල් මිළ දී ගැනීම, ණයට ගැනීම, හෝ භාර ගැනීම, හෝ යම් කිසි තැනැත්තකුට රත්රන් හෝ විදේශීය ව්‍යවහාර මුදල් විකිණීම හෝ ණයට දීම, හෝ යම් කිසි තැනැත්තකු සමග විදේශීය ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම නො කළ යුතු ය ; තවද

(ආ) බලය ලත් වෙළෙන්දකු නො වන, ශ්‍රී ලංකාවෙහි නේවාසික කිසි ම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී, බලය ලත් වෙළෙන්දකු නොවන යම් කිසි තැනැත්තකුගෙන් රත්රන් හෝ විදේශීය ව්‍යවහාර මුදල් මිළ දී ගැනීම හෝ ණයට ගැනීම හෝ යම් කිසි තැනැත්තකුට රත්රන් හෝ විදේශීය ව්‍යවහාර මුදල් විකිණීම හෝ ණයට දීම නො කළ යුතු ය :

එසේ වුව ද, බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් දෙනු ලබන විධානවලට අනුකූල ව ශ්‍රී ලංකාවේ යම් කිසි තැපැල් කාර්යාලයකදී තැපැල් ඇණවුම් හෝ මුදල් ඇණවුම් ආකාර යෙන් විදේශීය ව්‍යවහාර මුදල් විකිණීම සහ මිළ දී ගැනීම මේ උපවගන්තියෙහි පෙරාතු ව වූ විධිවිධානවලින් තහනම් නො වන්නේ ය.".

**3.** ප්‍රධාන පනතේ 7 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන පනතේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2—ඒ 01055—9557 (73/09)

"ශ්‍රී ලංකාව තුළදී කරනු ලබන ගෙවීම්.

7. බැංකුවේ අවසරය ඇති ව මිස, කිසි ම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාව තුළ දී—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට හෝ තැනැත්තකුගේ බැරට යම් කිසි ගෙවීමක් කිරීම, හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ව සිටින තැනැත්තකුගේ නියමයෙන් හෝ තැනැත්තකු වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින තැනැත්තකුට හෝ තැනැත්තකුගේ බැරට යම් ගෙවීමක් කිරීම, හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින යම් කිසි තැනැත්තකුගේ බැරට යම් මුදලක් තැන්පත් කිරීම හෝ ඇරීම

නො කළ යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ව සිටින තැනැත්තකු විසින් ගෙවීමට තිබෙන ණයක් ගෙවා නිම කිරීමේ දී හෝ ගෙවා නිම කිරීම සඳහා ඔහු විසින් මුදලක් ගෙවා තිබෙන අවස්ථාවක, ඒ ගෙවීම පිළිගැනීම හෝ සටහන් කර ගැනීම මේ වගන්තියේ (ඇ) ඡේදයෙන් තහනම් නො වන්නේ ය.".

ප්‍රධාන පනතේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන පනතේ 22 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :—

'(3) නියමයෙහි දැක්වෙන යම් ගමනාන්තයක් කරා කිසි ම භාණ්ඩයක් බැංකුවේ අවසරය ඇති ව හැර ශ්‍රී ලංකාවෙන් අපනයනය නො කළ යුතු යැ යි, ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(4) විකිණීමේ කාර්යය සඳහා භාණ්ඩ අපනයනය කිරීම පිළිබඳ ව (3) වන උපවගන්තිය යටතේ අවසර දීමේ දී—

(අ) ඒ ගමනාන්තය කරා අපනයනය කෙරෙන ඒ පංතියට හෝ වර්ගයට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් නියම කරනු ලබන මාර්ගයකින් හෝ ක්‍රමයකින් ශ්‍රී ලංකාවෙහි නේවාසික තැනැත්තකු වෙත ඒ භාණ්ඩ සඳහා ගෙවා තිබෙන බවට හෝ අපනයන දිනයෙන් පසු මාස හයක් පසු වන්නට පෙර එසේ ගෙවනු ලබන බවට; සහ

(ආ) ගෙවා තිබෙන හෝ ගෙවීමට තිබෙන මුදලෙන් සියලු කරුණු අනුව ජාතික යහපත උදෙසා ඒ භාණ්ඩවල සතුටුදායක ලාභයක් නියෝජනය වන බවට

බැංකුව සෑහීමට පත් විය යුතු ය:

එසේ වුව ද, විධානය අදාළ වන අවශ්‍යතාවන් හිදී, මේ උපවගන්තියේ (අ) ඡේදය, එහි දැක්වෙන මාස හයක් පිළිබඳ සඳහන වෙනුවට විධානයෙහි දැක්වෙන ඊට වඩා දික් වූ හෝ කෙටි වූ කාලයක් පිළිබඳ සඳහන ආදේශ කර තුබුවාක් මෙන් හෝ "අපනයන දිනයෙන් පසු මාස හයක් පසු වන්නට පෙර එසේ ගෙවනු ලබන බවට" යන වචන අත්හැර තැබුවාක් මෙන් බලපැවැත්විය යුතු යැ යි බැංකුව විසින් විධාන කළ හැකි ය.'; තවද,

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

29අ වන, 29ආ වන සහ 29ඇ වන අලුත් වගන්ති ප්‍රධාන පනතෙහි අන්තර්ගත කිරීම.

5. ප්‍රධාන පනතේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් අන්තර්ගත කරනු ලබන අතර එම වගන්ති ඒ පනතේ 29අ වන, 29ආ වන සහ 29ඇ වන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

සංචාරික සේවා, නැව් නියෝජ්‍යත්ව සහ ගුවන් නැව් මාර්ග නියෝජ්‍යත් ව.

29අ. බැංකුව විසින් කලින් කල නියම කරනු ලබන කොන්දේසිවලට හා නියමයන්ට අනුකූලව මිස, කිසි ම තැනැත්තකු විසින් යම් සංචාරික, ගුවන් නැව් මාර්ග හෝ නැව් සේවයක් ක්‍රියා කර වීම නොහොත් පවත්වාගෙන යෑම හෝ නැව් නියෝජිතයන් හෝ ගුවන් නැව් මාර්ග නියෝජිත යන් වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටීම නො කළ යුතු ය.

බැංකුව විසින් නියම කරන ලද කොන්දේසිවලට සහ නියමයන්ට අනුකූලව නියමිත සේවා ඉටු කළ යුතු බව.

29ආ. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් බැංකුව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ නියමයන්ට අනුකූල ව හැර, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික කිසි ම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු සඳහා යම් නියමිත සේවයක් ඉටු නො කළ යුතු ය.

ඇතැම් සමාගම් සහ ව්‍යාපාරික ආයතන ශ්‍රී ලංකාවෙහි නියෝජිතයන් හෝ කාර්මික උපදේශකයන් වශයෙන් පත් කරනු ලැබීම සීමා කිරීම.

29ඇ. මේ පනතේ වෙන යම් කිසි විධිවිධානයක ඇතුළත් කිසිවක් නො තකා, ශ්‍රී ලංකාවෙහි බල පවත්නා යම් කිසි නීතියක් යටතේ සංස්ථාගත නො වූ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් කිසි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කෙළින්ම හෝ අන් අයුරකින් පාලනය කරනු ලබන (බැංකු සමාගමක් නො වන) සමාගමක් විසින් හෝ එබඳු යම් කිසි සමාගමක ශ්‍රී ලංකාවෙහි යම් කිසි ශාඛාවක් හෝ කාර්යාලයක් විසින් හෝ ශ්‍රී

ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ගෙන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමන්විත ව්‍යාපාරික ආයතනයක් විසින්, බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ අවසරය ඇති ව හැර—

(අ) යම් කිසි තැනැත්තකුගේ, සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක වෙළෙඳ හෝ වාණිජ ගනුදෙනුවලදී ඒ තැනැත්තාගේ, සමාගමේ හෝ ව්‍යාපාරික ආයතනයේ ශ්‍රී ලංකාවෙහි නියෝජිතයා වශයෙන්, හෝ

(ආ) යම් කිසි තැනැත්තකුගේ, සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක ශ්‍රී ලංකාවෙහි කාර්මික හෝ කළමනාකාර උපදේශක වශයෙන්

පත්වීම් භාර නො ගත යුතු ය; ඒ අවසරය නොමැති ව ඒ පත්වීම භාර ගනු ලැබූ අවස්ථාවක ඒ පත්වීම ශූන්‍ය විය යුතු ය.''.

ප්‍රධාන පනතේ 30 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

6. ප්‍රධාන පනතේ 30 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

'විදේශීය සමාගම් පිළිබඳ ඇතැම් විධිවිධාන.

30. (1) මෙහි මින් මතු සඳහන් යම් කිසි නියමය කට අනුකූල ව යම් විදේශීය සමාගමක් ක්‍රියා කිරීම බැංකුව විසින් අපේක්ෂිත බවට වූ ලිඛිත දන්වීමක් ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් කිසි තැනැත්ත කුට භාරදෙනු ලැබ, ඒ තැනැත්තා විසින්, යම් කිසි ක්‍රියාවක් කිරීමෙන් හෝ කිරීමෙන් වැළකී සිටී මෙන්,—

(අ) ඒ විදේශීය සමාගමට ඒ නියමයන් ගෙන් යම් කිසි නියමයකට අනුකූල ව ක්‍රියා කරනු ලැබීමට සැලැස්වීම; හෝ

(ආ) ඒ විදේශීය සමාගම විසින් ඒ නියමයන් ගෙන් යම් කිසි නියමයකට අනුකූල ව ක්‍රියා කරනු ලැබීමට ඇති යම්කිසි බාධක යක් ඉවත් කිරීම; හෝ

(ඇ) ඒ විදේශීය සමාගම විසින් ඒ නියමයන් ගෙන් යම් කිසි නියමයකට අනුකූල ව ක්‍රියා කරනු ලැබීම යම් ලෙසකින් වඩාත් සම්භාව්‍ය කරලීම

කළ හැකි අවස්ථාවක, ඊට පටහැනි ව බැංකුව විසින් අවසර දිය හැකි තාක් දුරට හැර, ඒ තැනැත්තා විසින් ඒ ක්‍රියාව කළ යුතු ය; නැත හොත් අවස්ථාවෝචිත පරිදි, කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දිය හැකි වන්නේ යම් නියමයක් සම්බන්ධයෙන් ද ඒ නියමයන් මෙසේ ය. එනම්, ඒ විදේශීය සමාගම විසින්—

(අ) ඒ සමාගමේ වත්කම් හා ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් ඒ දැන්වීමෙහි සඳහන් වන විස්තර බැංකුව වෙත සැපයිය යුතු ය;

(ආ) විකිණීමට හෝ විකිණීම සැලැස්වීමට ඒ සමාගමට හිමිකම් ඇති විදේශ විනිමය වන, දැන්වීමෙහි සඳහන් යම් විදේශ විනිමයක් බලය ලත් වෙළෙන්දකුට විකිණිය යුතු ය; නැතහොත් විකිණීම සිද්ධ කරවිය යුතු ය;

(ඇ) දැන්වීමෙහි සඳහන් වන ලාභාංශ ප්‍රකාශ කොට ගෙවිය යුතු ය;

(ඈ) දැන්වීමෙහි සඳහන් ස්වකීය වත්කම්වලින් යම් කිසි වත්කමක් එසේ සඳහන් වන ආකාරයෙන් මුදල් කළ යුතු ය;

(ඉ) දැන්වීමෙහි සඳහන් වන යම් සාධන පත්‍රයක් නැතහොත් එවැනි සුරැකුම් පත් විකිණීමෙන් හෝ පැවරීමෙන් හෝ ඒ පිළිබඳ ස්වකීය අයිතිවාසිකම්වලට හෝ බලතලවලට බලපාන යම් දෙයක් කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

(3) බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ අවසරය ඇති ව හැර, ශ්‍රී ලංකාවෙහි නේවාසික කිසි ම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙහි නේවාසික තැනැත්තන් විසින් පාලනය කරනු ලබන යම් කිසි ව්‍යාපාරයක් එසේ පාලනය කරනු ලැබීම අවසන් කෙරෙන යම් කිසි ක්‍රියාවක් නොකළ යුතු ය.

(4) වෙන යම් කිසි නිතියක කුමක් සඳහන් වුව ද ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් එසේ ම ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙත කරන ලද ශ්‍රී ලංකාවෙහි යම් කිසි ව්‍යාපාරයක යම් කිසි අයිතිවාසිකමක කිසි ම පැවරුමක්, ඒ පැවරුම්කරු හෝ පැවරුම්ලාභී විසින් ඒ පැවරුම ස්ථිර කිරීම සඳහා බැංකුව වෙත කරනු ලැබූ ඉල්ලීමක් පිට බැංකුව විසින් ඒ පැවරුම ස්ථිර කරනු ලැබී නම් මිස, වලංගු නො විය යුතු ය. මේ උපවගන්තියේ පෙරාතුව වූ විධි විධාන සමාගමක යම් කිසි කොටසක් පැවරීම කෙරෙහි අදාළ නො විය යුතු ය.

(5) බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ අවසරය ඇති ව හැර, ශ්‍රී ලංකාවෙහි නේවාසික කිසි ම තැනැත්තකු විසින් විදේශීය රාජ්‍යයක පුර වැසිය කුට හෝ ඔහුගේ නමට යම් ව්‍යාපාරයක යම් අයිති වාසිකමක් නොපැවරිය යුතු ය; නැතහොත් එබඳු යම් ව්‍යාපාරයක යම් අයිතිවාසිකමක් ඇති නො කළ යුතු ය.

(6) බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ අවසරය ඇති ව හැර, ශ්‍රී ලංකාවෙහි නේවාසික කිසි ම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගේ යම් කිසි ණයක් හෝ වෙන යම් කිසි බැරකමක් හෝ බැඳීමක් පිළිබඳ වගකීමකට නො බැඳිය යුතු ය.

(7) බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ අවසරය ඇති ව හැර, ශ්‍රී ලංකාවෙහි නේවාසික කිසි ම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් කෙළින්ම හෝ අන් අයුරකින් පාලනය කරනු ලබන (බැංකු සමාගමක් නොවන) යම් කිසි ව්‍යාපාරික ආයතනයකට හෝ සමාගමකට යම් කිසි මුදලක් ණයට නො දිය යුතු ය.

(8) මේ වගන්තියෙහි "විදේශීය සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවෙහි බලපවත්නා යම් කිසි නීතියක් යටතේ සංස්ථාගත නො වූ ද පහත සඳහන් කොන්දේසිවලින් යම් කිසි කොන්දේසියක් සපුරාලූ ද සමාගමක් අදහස් වේ:—

(අ) ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් කිසි තැනැත්තකු නොහොත් තැනැත්තන් විසින් (කෙළින් ම හෝ අන් අයුරකින්) යම් කිසි උපක්‍රමයක් මගින් ඒ සමාගම පාලනය කරනු ලබන බව; හෝ

(ආ) ඒ සමාගම ඈවර කරනු ලැබීමේදී එහි කොටස් ප්‍රාග්ධන හෝ ණය ප්‍රාග්ධන හිමියන්ට ලැබිය යුතු මුදල්වලින් අඩ කට වඩා, ශ්‍රී ලංකාවෙහි නේවාසික තැනැත්තන්ට හෝ ඔවුන්ගේ ප්‍රති ලාභය සඳහා කෙළින් ම හෝ අන් අයුර කින් ලැබිය යුතු බව; හෝ

(ඇ) ඒ සමාගම ඈවර කරනු ලැබීමේදී ණය හිමි යන්ට ගෙවීමෙන් පසු බෙදා හැරීමට තිබෙන වත්කම්වලින් හරි අඩකට වඩා ශ්‍රී ලංකාවෙහි පදිංචි යම් කිසි තැනැත්ත කුට නොහොත් තැනැත්තන්ට හෝ

තැනැත්තකුගේ නොහොත් තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් ලැබිය හැකි බව; හෝ

(ඇ) (i) ඒ සමාගමේ ණය හෝ ණය ප්‍රාග්ධනය සඳහා ගෙවිය යුතු යම් කිසි පොලියක් වෙතොත් එයින්; හෝ

(ii) ඒ සමාගමේ වරණීය කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් ගෙවිය යුතු ලාභාංශ කිසිවක් වෙතොත් එයින්; හෝ

(iii) ඒ සමාගමේ වරණීය කොටස් ප්‍රාග්ධනය නොවන එහි කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් ගෙවිය යුතු ලාභාංශ කිසිවක් වෙතොත් එයින්

හරි අඩකට වඩා ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් කිසි තැනැත්තකුට නොහොත් තැනැත්තන්ට හෝ තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් ලැබිය හැකි බව.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා, යම් කිසි මුදල්, වත්කම්, පොලී හෝ ලාභාංශ යම් කිසි තැනැත්තකුට නොහොත් තැනැත්තන්ට හෝ තැනැත්තකුගේ නොහොත් තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් ලැබිය හැකි ද ඒ තැනැත්තාගේ නොහොත් තැනැත්තන්ගේ අනන්‍යතාව ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් කිසි තැනැත්තකු විසින් ඒ සඳහා තමා වෙත පැවරී තිබෙන බලයක් ක්‍රියාත්මක කිරීම මත රැඳී පවත්නා අවස්ථාවක, ඒ මුදල්, වත්කම්, පොලී හෝ ලාභාංශ ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් තැනැත්තකුට නොහොත් තැනැත්තන්ට හෝ තැනැත්තකුගේ නොහොත් තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් ලැබිය හැකි ලෙස සැලකිය යුතු ය.'.

ප්‍රධාන පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන පනතේ 31 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් කිසි තැනැත්තකුගේ බැරට ගෙවීමක් කිරීම හෝ මුදලක් තැන්පත් කිරීම සඳහා යම් තැනැත්තකු විසින් බැංකුවේ අවසරය ඉල්ලන අවස්ථාවක, ගෙවිය යුතු හෝ බැර කිරීමට යන ඒ මුදල ආවෘත ගිණුමකට පමණක් ගෙවිය යුතු යැයි හෝ බැර කළ යුතු යැ යි බැංකුව විසින් විධාන කළ හැකි ය. බැංකුව විසින් ඒ විධානය කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ මුදල ආවෘත ගිණුමකට ගෙවිය යුතු ය; නැතහොත් බැර කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(2) ආවෘත ගිණුමකට පමණක් ගෙවීමක් කළ යුතු යැ යි බැංකුව විසින් විධාන කරනු ලබන අවස්ථාවක,—

(අ) ඒ ගෙවීම කරනු ලැබිය හැකි ආකාරය—

(i) ගෙවීම කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ බැරට ද ඒ තැනැත්තාගේ ආවෘත ගිණුමකට ඒ ගෙවීම බැර කළ යුතු බවට වූ විධානයක් සමග බැංකුකරුට ගෙවීම විය යුතු ය. චෙක් පතක් හෝ වොරන්ට් බල පත්‍රයක් මගින් ඒ ගෙවීම කරනු ලබන අවස්ථාවක, "(ඒ තැනැත්තාගේ නම සඳහන් කරමින්) ගේ ආවෘත ගිණුමට" යන වචන හෝ ඊට සමාන වචන ඒ චෙක් පතෙහි හෝ වොරන්ට් බලපත්‍රයෙහි ලකුණු කරමින් ඒ විධානය දිය යුතු ය, නැතහොත්

(ii) "ආදායකයාගේ ආවෘත ගිණුමට පමණක් ගෙවිය යුතු ය" යන වචන හෝ ඊට සමාන වචන ලකුණු කරමින් ඒ තැනැත්තා නමට ලියන ලද රේඛිත චෙක් පතක් හෝ වොරන්ට් බලපත්‍රයක් මගින් විය යුතු ය; තව ද

(ආ) එකතු කර ගන්නා ලද මුදල බැංකුකරු විසින් ඒ තැනැත්තාගේ ආවෘත ගිණුමකට බැර කළ යුතු ය.';

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ අතුරු විධානය අත් හැරීමෙන්.

8. ප්‍රධාන පනතේ 39 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන පනතේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනතේ වෙනත් විධිවිධානයක් කිසිවකට හානියක් නොමැති ව, බැංකුව විසින්, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික යම් කිසි තැනැත්තකු වෙත—

(අ) විධානවල දක්වෙන කාලයක් ඇතුළත සහ එසේ ම දැක්වෙන ආකාරයෙන්, බැංකුව වෙත හෝ එය නියම කිරීම සඳහා බලය පවරනු ලැබූ තැනැත්තකු ලෙස ඒ විධානවල නිර්දිෂ්ට යම් කිසි තැනැත්තකු වෙත, මේ පනතේ විධිවිධානවලට අනුකූල ව ක්‍රියා කරන බවට වග බලා ගැනීමේ හෝ ඒ විධිවිධාන මගහැරීම සොයා දැනගැනීමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි බැංකුවට හෝ එසේ බලය පවරනු ලැබූ තැනැත්තාට අවශ්‍ය වන්නා වූ තම සන්තකයෙහි ඇති යම් තොරතුරක් සපයන ලෙස හෝ, ඒ තැනැත්තාගේ සන්තකයෙහි ඒ තොරතුර නොමැති අවස්ථාවක, ඒ විධානවල දැක්වෙන්නා වූ ශ්‍රී ලංකාවෙහි හෝ එතෙර සිටින යම් කිසි තැනැත් තකුගෙන් ඒ තොරතුර ලබා ගෙන බැංකුව වෙත හෝ ඒ බලය පවරනු ලැබූ තැනැත්තා වෙත ඒ තොරතුර සපයන ලෙස ; හෝ

(ආ) ඒ විධානවල දැක්වෙන යම් කිසි කරුණක් හෝ කරුණු පිළිබඳ ව තමා විභාග කරනු ලැබිය හැකි වන සේ ඒ විධානවල නිශ්චිත ව සඳහන් යම් නිල ධරයකු ඉදිරියෙහි එහි සඳහන් වන ස්ථානයක දී එසේ සඳහන් වන දිනයක එසේ ම සඳහන් වන වේලාවක දී පෞද්ගලික ව පෙනී සිටින ලෙස

ඔහුට නියම කරමින් විධාන නිකුත් කළ හැකි ය.";

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් උපවගන්තිය අන්තර්ගත කිරීමෙන් :—

"(1අ) (1) (ආ) වන උපවගන්තියේ විධිවිධාන යටතේ විභාග කරනු ලබන යම් තැනැත්තකු විසින් තමා විභාග කරන නිලධරයා තමාගෙන් අසන සියලු ප්‍රශ්නවලට සත්‍ය ලෙස පිළිතුරු දිය යුතු ය."; තව ද

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය අන්තර්ගත කිරීමෙන් :—

'(5) මේ වගන්තියෙහි "බැංකුව" යන්නෙහි මේ වගන්තියෙන් පිරිනැමුණු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ රේගු දෙපාර්තමේන්තුවේ යම් කිසි නිලධරයෙක් ඇතුළත් වේ.'.

ප්‍රධාන පනතේ 30අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** 1972 අංක 14 දරන පනතින් ප්‍රධාන පනතේ අන්තර්ගත කරන ලද 30අ වන වගන්තියෙහි (6) වන ඡේදයේ දැක්වෙන "වාහනය හෝ යාත්‍රාව" යන වචන වෙනුවට "වාහනය, ගුවන් නැව හෝ යාත්‍රාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන පනතේ 40 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**10.** ප්‍රධාන පනතේ 40 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

"ස්ථාන සෝදිසි කිරීම.

40. (1) (අ) මේ පනත යටතේ වූ වරදක් කර තිබෙන බව හෝ කරනු ලබන බව සැක කිරීමට යුක්ති සහගත හේතු ඇති බවට හා ඒ වරද කිරීම පිළිබඳ සාක්ෂි යම් කිසි ස්ථානයකින් හෝ යම් කිසි යාත්‍රාවකින්, වාහනය කින් හෝ ගුවන් නැවකින් හෝ යම්කිසි තැනැත්තකු වෙතින් සොයා ගත හැකි බවට ; හෝ

(ආ) 39 වන වගන්තිය යටතේ ඉදිරිපත් කළ යුතු ව තිබී එසේ ඉදිරිපත් නොකරනු ලැබූ යම් කිසි පොත්, ගණන් හෝ වෙනත් ලේඛන ඒ ස්ථානයෙන් හෝ එසින් යම් වාහනයකින්, යාත්‍රාව කින් හෝ ගුවන් නැවකින් හෝ ඒ තැනැත්තා වෙතින් සොයා ගත හැකි බවට ; හෝ

(ඈ) යම් විදේශීය ව්‍යවහාර මුදල් එසින් යම් ස්ථානයකින් හෝ එයින් යම් වාහනයකින්, යාත්‍රාවකින් හෝ ගුවන් නැවකින් හෝ එයින් යම් තැනැත්තකු වෙතින් සොයා ගත හැකි බවට

විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා ක්‍රියා කිරීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් බලය දෙනු ලබන ඔහුගේ සහකාරයකු වශයෙන් නිලනාමයෙන් හැඳින්වෙන යම් නිලධර යකු හෝ රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයාගේ සහකාරයකුට නොඅඩු පදවියක් දරන යම්කිසි රාජ්‍ය නිලධරයකු සැහීමට පත් වුවහොත්, ඒ ස්ථානයට හෝ අවස්ථාවෝචිත පරිදි ඒ වාහනය, යාත්‍රාව හෝ ගුවන් නැව තිබිය හැකි හෝ ඒ තැනැත්තා සිටිය හැකි යම් ස්ථානයකට ඇතුළුවී ඒ ස්ථානය හෝ අවස්ථාවෝචිත පරිදි ඒ වාහනය, යාත්‍රාව හෝ ගුවන් නැව හෝ තැනැත්තා සෝදිසි කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් හෝ ඒ නිලධරයා විසින් කළ හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් හෝ ඒ නිලධරයා විසින් ඒ ස්ථානයෙන් හෝ ඒ වාහන යෙන්, යාත්‍රාවෙන් හෝ ගුවන් නැවෙන් හෝ ඒ තැනැත්තා වෙතින් සොයා ගත්, මේ පනත යටතේ වූ යම් වරදක් කිරීම පිළිබඳ සාක්ෂි බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඔහුට තිබෙන යම් කිසි ද්‍රව්‍යයක් හෝ 39 වන වගන්තිය යටතේ ඉදිරිපත් කළ යුතු ව තිබුණු සි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඔහුට තිබෙන පොත්, ගණන් හෝ ලේඛන කිසිවක් තහනමට ගත හැකි ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ වූ සෝදිසියකදී ස්ත්‍රියක විසින් හැර කිසි ම ස්ත්‍රියක සෝදිසි නොකළ යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාර යම් කිසි ස්ථානය කට ඇතුළු වීමේ යම් කිසි බලයක් යම් කිසි තැනැත්තකුට තිබෙන අවස්ථාවක, ඔහු විසින් ඒ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යුක්ති සහගත ව අවශ්‍ය බලය පාවිච්චි කළ හැකි ය.

(4) මේ වගන්තිය ප්‍රකාර තැනැත්තකු සෝදිසි කිරීම සඳහා නිලධරයකුට බලය තිබෙන අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා සෝදිසි කරනු ලැබිය හැකි අතර තමා සෝදිසි කරන නිලධරයා විසින් තමාගෙන් අසනු ලබන සියලු ප්‍රශ්නවලට සත්‍ය ලෙස පිළිතුරු දීම ඒ තැනැත්තා විසින් කළ යුතු ය.

(5) කිසි ම තැනැත්තකු විසින්, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර වෙන යම් තැනැත්තකු වෙත පැවරී තිබෙන යම් කිසි බල තල ක්‍රියාත්මක කිරීමේ දී ඒ වෙනත් තැනැත්තාට අවහිර නොකළ යුතු ය.

(6) මේ වගන්තිය යටතේ යම් කිසි ක්‍රියාවක් කිරීම සඳහා බලය දෙනු ලැබූ යම් කිසි තැනැත්තකු විසින් ඒ ක්‍රියාව කිරීම සඳහා සාම නිලධරයකුගේ සහාය ලබා ගැනීම සුදුසු යැයි සිතනු ලැබේ නම් ඔහු විසින් ඒ සහාය ලබාගත හැකි ය. ".

49ආ වන අලුත් වගන්තිය ප්‍රධාන පනතෙහි අන්තර්ගත කිරීම.

**11.** ප්‍රධාන පනතේ 49අ වන වගන්තියට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් අන්තර්ගත කරනු ලබන අතර එම වගන්තිය ඒ පනතේ 49ආ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය:—

" ඇතැම් ලේඛනවල ආවේශ්‍යතාව.

49ආ. මේ පනත යටතේ වූ යම් කිසි වරදක් පිළිබඳ යම් කිසි නීති කටයුත්තක දී, පහත සඳහන් ලේඛනවලින් යම් කිසි ලේඛනයක් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ යම් කිසි චූදිතයකුට විරුද්ධ ව සාක්ෂි වශයෙන් දිය හැකි අතර, එය එහි අඩංගු කරුණු, ගනුදෙනු හෝ ගණන් පිළිබඳ මූල් බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය:—

(අ) බැංකුවේ කළමනාකරුගෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරීගෙන් ලබා ගත්, බැංකුකරුගේ පොතක සහතික පිටපතක් හෝ එහි යම් උද්ධෘතයක සහතික පිටපතක් ;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකුගෙන් හෝ ලේකම්ගෙන් ලබා ගත්, සමාගමක් විසින් පවත්වා ගෙන යා යුතු යැයි නීතියෙන් නියමිත යම් පොතක හෝ වෙනත් වාර්තාවක සහතික පිටපතක් හෝ එහි යම් උද්ධෘතයක සහතික පිටපතක් ; සහ

(ඇ) විදේශීය ආණ්ඩුවක නිලධරයකුගෙන් ලබා ගත් ඒ විදේශීය ආණ්ඩුවේ නිලධරයාගේ නිසි භාරයෙහි තුබූ යම් ලේඛනයක සහතික පිටපතක් හෝ එහි යම් කිසි උද්ධෘතයක සහතික පිටපතක්.".

12. ප්‍රධාන පනතේ 50අ වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය අන්තර්ගත කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන පනතේ 50අ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා 39 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් කිසි නිලධරයකු මහා බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිලධරයකු ලෙස සැලකිය යුතු ය.".

13. ප්‍රධාන පනතේ 51 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන පනතේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනතෙහි හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන හෝ මේ පනත යටතේ දෙනු ලැබූ යම් විධානයක් හෝ නියම කරනු ලැබූ යම් කොන්දේසියක් හෝ නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ එහි නේවාසික යම් කිසි තැනැත්තකු ඒ වරද මේ පනතේ IV වන කොටස ප්‍රකාර රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ ද දඬුවම් කළ හැකි බව නොතකා, වරදකරුවකු විය යුතු ය.";

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) මේ පනත යටතේ වූ වරදක් කරන යම් කිසි තැනැත්තකු—

(අ) මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස දහ අටකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම ; හෝ

(ආ) දිසා අධිකරණයක් ඉදිරිපිට වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම

යටත් විය යුතු ය; තව ද ඒ වරද රත්‍රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ වෙනත් දේපළ කිසිවකට සම්බන්ධ වූ අවස්ථාවක, රාජ්‍ය සන්තක කිරීම සුදුසු යැයි අධිකරණය අදහස් කරන්නේ නම් ඒ රත්‍රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ රාජ්‍ය සන්තක කරන ලෙස ඒ අධිකරණය විසින් ආඥා කළ හැකි අතර මේ උපවගන්තිය යටතේ රාජ්‍ය සන්තක කරනු ලැබූ රත්‍රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ කිසිවකට සුදුස්සක් කිරීම හෝ එය බැහැර කිරීම අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ආකාරයෙන් කළ යුතු ය."; තවද

(3) එහි (6) වන උපවගන්තියෙන් ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති අන්තර්ගත කිරීමෙන් :—

"(7) බැංකුවේ වුවමනාව පිට හෝ අනුඥව ඇති ව හැර මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ කිසි ම නඩු පැවරීමක් ආරම්භ නො කළ යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ ඉහත දක්වෙන විධිවිධාන නීතිපති විසින් හෝ නීතිපතිගේ වුවමනාව පිට හෝ ආරම්භ කරන ලද නඩු පැවරීමකට අදාළ නො විය යුතු ය.

(8) මේ පනත යටතේ වූ සියලු වැරදි, අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා ඒ සංග්‍රහයේ පළමුවන උපලේඛනයෙහි ඇතුළත් කිසිවක් නො තකා, සංඥේය වැරදි විය යුතු ය.

(9) ශ්‍රී ලංකාවෙන් පිටත දී කරන ලද, මේ පනත යටතේ වූ යම් කිසි වරදක් කොළඹ කොට්ඨාශයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට හෝ කොළඹ දිසා අධිකරණය ඉදිරිපිට, වෙන යම් නීතියක ඇති කිසිවක් නොතකා, නඩු විභාගයට භාජනය කළ හැකි ය.".

ප්‍රධාන පනතේ 52 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

14. ප්‍රධාන පනතේ 52 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

"බැංකුව විසින් දණ්ඩන නියම කිරීම.

52. (1) මේ පනත යටතේ නඩු පැවරීමක් ආරම්භ කිරීමට පෙර, බැංකුවෙහි මතය අනුව මේ පනත යටතේ වරදක් කර ඇති යම් තැනැත්තකුට, නිවේදනයෙහි දැක්වෙන කාලයක් ඇතුළත රුපියල් දෙදහසකට නො වැඩි මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවන ලෙස බැංකුව විසින් ලියවිල්ලකින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් වරද රත්‍රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, ගෙවීම්, භාණ්ඩ හෝ වෙනත් දේපළ කිසිවක් හා සම්බන්ධව ඇති විට හා ඒ පිළිබඳ තොරතුරු සපයන ලෙස හෝ ඊට සම්බන්ධ පොත්, ගණන් හෝ වෙනත් ලේඛන

ඉදිරිපත් කරන ලෙස 39 වන වගන්තිය යටතේ නියම කරනු ලැබූ කල්හි එසේ කිරීම පැහැර හැරීමක් පමණක් නො වන අවස්ථාවක—

(අ) බැංකුව විසින් සිය නියමය පිළිබඳ නිවේදනයෙහි දක්වා ඇති කාලය ඇතුළත ඒ රත්රන්වල, ව්‍යවහාර මුදල්වල, සුරැකුම් පත්වල, ගෙවීම්වල, භාණ්ඩවල හෝ දේපළෙහි මුදල මෙන් හෝ වටිනාකම මෙන් තුන් ගුණයකට නොවැඩි අතිරේක මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවන ලෙස ඒ තැනැත්තාට ලියවිල්ලකින් නියම කළ හැකි අතර,

(ආ) එසේ කිරීම සුදුසු යැයි බැංකුව අදහස් කරයි නම්, ඒ රත්රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ බැංකුවට භාර දෙන ලෙස බැංකුව විසින් ලියවිල්ලකින් නියම කළ හැකි ය.

(3) බැංකුවට භාර දෙන ලෙස බැංකුව විසින් (2) (ආ) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, බැංකුවට භාර දීමට නියම කරනු ලැබූ රත්රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ සන්තක ව සිටින තැනැත්තාට දැන්විය යුතු අතර ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීම ලැබුණු විට, ඒ රත්රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ බැංකුවට භාර දිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ බැංකුවට භාරදෙනු ලැබූ රත්රන්, ව්‍යවහාර මුදල්, භාණ්ඩ හෝ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන ආකාරයෙන් කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ දණ්ඩනයක් වශයෙන් නියම කරනු ලැබූ යම් මුදලක් පහත සඳහන් ආකාරයෙන් බැහැර කළ යුතු ය:—

(අ) ඒ මුදලින් හරි අඩක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර,

(ආ) ඒ මුදලෙහි ඉතිරි අඩ, බැංකුවේ මතය අනුව, (1) වන උපවගන්තියෙහි සඳහන් වරදක් සොයා දැනගැනීමට ඉවහල් වූ තොරතුරු සැපයූ යම් දැනුම් දෙන්නකු හෝ දැනුම් දෙන්නන් අතර බෙදා දිය හැකි ය; නැතහොත් ඒකාබද්ධ අරමුදලට බැර කළ හැකි ය.

(6) මේ වගන්තිය යටතේ බැංකුව විසින් තමාට විරුද්ධ ව නියමයක් නිකුත් කරනු ලැබූ කිසිම තැනැත්තකු විසින්, ඒ බැංකුවේ අවසරය ඇති ව හැර, ඒ නියමයට අනුකූල ව ක්‍රියා කරනු ලැබීම සහ ඒ නිවේදනයෙහි දැක්වෙන කාලය අවසන් වීමෙන් පසු මාස දෙකක කාලය ඉකුත් වීම යන දෙකින් කලින් පැමිණෙන අවස්ථාව එළඹෙන තුරු, තමාට අයත් යම් නිශ්චල දේපළ හෝ සුරැකුම් පත් විකිණීම, උකස් කිරීම, අන් සතු කිරීම, පැවරීම හෝ කවර වූ හෝ ආකාරයකින් බැහැර කිරීම නො කළ යුතුය :

එසේ වුව ද ඒ නියමයට අනුකූල ව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ විට ඒ තැනැත්තා විසින් කරන ලද වරද පිළිබඳ යම් නඩුවක් ඉහත කී මාස දෙකක කාලය ඉකුත් වීමට පෙර ඒ තැනැත්තාට විරුද්ධ ව යම් කිසි අධිකරණයක පවරා තිබෙන අවස්ථාවක, මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල සඳහන් දේපළ බැහැර කිරීමේ තහනම අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි තවදුරටත් වූ කාලයක් තුළ අඛණ්ඩව පැවතිය යුතු යැ යි ඒ අධිකරණය විසින් විධාන කළ හැකි ය.

(7) බැංකුව විසින් මේ වගන්තිය යටතේ තමාට විරුද්ධ ව නියමයක් කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ නියමය තමා වෙත දන්වනු ලැබීමෙන් පසු දින විසි එකක් ඇතුළත ඊට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය. ඒ නියමයට විරුද්ධත්වය දැක්වීමේ හේතු ඒ අභියාචනයෙහි සඳහන් විය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට, නියම කර ඇති දඬුවම ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම, නැතහොත් බැංකුවට භාර කිරීමට නියම කරනු ලැබූ රත්රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ සම්බන්ධයෙන් තමා විසින් සුදුසු යැ යි සිතිය හැකි විධාන නිකුත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

(9) යම් කිසි තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ වගන්තිය යටතේ නියම කර ඇති දණ්ඩන මුදල බැංකුවට ගෙවන හෝ ඒ දණ්ඩන මුදල ගෙවා මේ වගන්තිය යටතේ බැංකුවට භාර කරනු ලැබීමට නියමිත රත්රන්, ව්‍යවහාර මුදල්, සුරැකුම් පත්, භාණ්ඩ හෝ දේපළ බැංකුවට භාර දෙන අවස්ථාවක, ඒ දණ්ඩනය නියම කරනු ලැබූයේ හෝ ඒ නියමය කරනු ලැබූයේ යම් වරදක්

සම්බන්ධයෙන් ද ඒ වරද වෙනුවෙන් වූ නඩු පැවරීමකට ඒ තැනැත්තා යටත් නො විය යුතු ය.".

**15.** ප්‍රධාන පනතේ 54 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන පනතේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "බැංකුව" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථන අන්තර්ගත කිරීමෙන් :—

'"බැංකුකරුගේ පොත" යන්නෙහි යම් ලෙජරයක්, දෛනික පොතක්, මුදල් පොතක්, ගිණුම් පොතක් සහ බැංකුවක සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාවිත වන වෙන යම් පොතක් ද ඇතුළත් වේ;

"බැංකු සමාගම" යන්නෙහි සමාගම් ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;';

(2) "ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථන අන්තර්ගත කිරීමෙන් :—

'යම් කිසි පොතක, වාර්තාවක, උද්ධෘතයක හෝ ලේඛනයක "සහතික පිටපත" යන්නෙන්, පිට පත ඒ පොතේ, වාර්තාවේ, උද්ධෘතයේ හෝ ලේඛනයේ සත්‍ය පිටපතක් බව ද ඒ පොත, වාර්තාව, උද්ධෘතය හෝ ලේඛනය තවමත් නිසි භාරයේ තිබෙන බව ද පැවසෙන සහතිකයක් ඇති ඒ පොතේ, වාර්තාවේ, උද්ධෘතයේ හෝ ලේඛනයේ පිටපතක් අදහස් වන අතර ඒ සහතිකය, එම දෙය භාර ව සිටින තැනැත්තාගේ නම සහ නිල නාමය සහිත ව ඒ තැනැත්තා විසින් පිටපත පහළින් ලියා දින යොදා අත්සන් තබා තිබිය යුතු ය;

"සමාගම" යන්නෙන් සමාගම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෙහි හෝ වෙන යම් කිසි රටක කලින් කල බල පවත්නා ප්‍රඥප්ති යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;';

(3) "සුරැකුම්පත්" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"සුරැකුම් පත්" යන්නෙන් කොටස්, ස්කන්ධ, බැඳුම්කර, යම් හවුල් ව්‍යාපාරයක ප්‍රාග් ධනය, (පොරොන්දු නෝට්ටු නො වන) නෝට්ටු, ණයකර, ණයකර ස්කන්ධ, ඒකක භාර යෝජනා ක්‍රමයක් යටතේ වූ ඒකක සහ තෙල් රාජ්‍ය භාගයක කොටස් අදහස් වේ.'; සහ ද

(4) "නිශ්චිත විදේශීය ව්‍යවහාර මුදල්" යන්නෙහි අර්ථ කථන යට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය අන්තර්ගත කිරීමෙන් :—

'"සංචාරික, ගුවන් නැව් මාර්ග හෝ නැව් සේවය" යන්නෙන් මේ පනතේ කාර්යයන් සඳහා සංචාරික, ගුවන් නැව් මාර්ග හෝ නැව් සේවයක් ලෙස නියමිත යම් පන්තියකට හෝ වර්ගයකට අයත් සේවයක් අදහස් වේ.'.